**ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය - 2023**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 9 ඡේදය ප්‍රකාරව, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා සීමා සහිත හැටන් නැෂනල් බැංකුවේ පවත්වා ගෙන යන 2023 දෙසැම්බර් 31 දිනට රු.292,790 ක් හා රු.246,815 ක්වූ ඉතිරි කිරීමේ ගිණුම් දෙකෙහි ශේෂය මුදල් සහ මුදල් හා සමාන දෑ යටතේ ඉදිරිපත් කල යුතු වුවත් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ කෙටි කාලීන ආයෝජන යටතේ ඉදිරිපත් කර තිබුණි. | වැරදීමකින් මෙම ඉතිරි කිරීම් ගිණුම් ශේෂයන් කෙටිකාලීන ආයෝජන තුළ සටහන් වී තිබෙන අතර ඉදිරියේ දී මුදල් හා සමාන දෑ යටතේ ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ)මධ්‍යස්ථානය විසින් 2022 වර්ෂය දක්වා අනුගමනය කළ හීනවන ශේෂ ක්‍රමය මත ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය, සමාලෝචිත වර්ෂයේදී වෙනස් කරමින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණද, ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස් කිරීමේදී හෙළිදරව් කළ යුතු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 34(අ) සිට (ඉ) දක්වා වූ ඡේදවල ඇතුළත් විය යුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය හීනවන ශේෂ ක්‍රමයේ සිට සරල මාර්ග ක්ෂය වෙන්කිරීමේ ප්‍රතිපත්තියට මාරු කිරීම සම්බන්ධයෙන් වන හෙළිදරව් කිරීම් 2024 ගිණුම් ප්‍රකාශන තුළින් ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 92(ආ) ඡේදය ප්‍රකාරව, මධ්‍යස්ථානය සතු 2023 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන දේපළ පිරියත හා උපකරණවල දළ ධාරණ අගය හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කරන අවස්ථාව වන විට 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ගිණුම් අංශයට ලැබී නොතිබීම නිසා විගණනය විසින් සඳහන් කර ඇති 2023.12.31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වෙන් කිරීම් සිදු කර ඇති වත්කම් හඳුනාගැනීමට නොහැකිවීම නිසා විගණනය විසින් සඳහන් කර ඇති ආකාරයට 2023.12.31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වෙන් කිරීම් සිදු කර ඇති තවමත් භාවිතයට ගනු ලබන වත්කම් සම්බන්ධයෙන් වාර්තා කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | ඵලදායි ජීවිතකාලය ඉක්මවා ඇති තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 9හි 15 හා 16 වගන්ති ප්‍රකාරව පරිත්‍යාග ලෙස මධ්‍යස්ථානයට ලැබී තිබූ පොත්ද ඇතුළුව 2023 දෙසැම්බර් 31 දිනට රු.3,288,420 ක් වූ විකිණීමට තබා ඇති පොත් තොගයේ වටිනාකම ගණනය කල පදනම හෙළිදරව් කර නොතිබුණි. තවද විගණනයට ඉදිරිපත් කරන ලද උප ලේඛනයට අනුව පරිත්‍යාග වශයෙන් ලද පොත්ද ඇතුළුව 17,704 ක් වූ මෙම පොත් ප්‍රමාණය පිරිවැයට අගය කර තිබුණද පොතක පිරිවැය තීරණය කළ ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පුස්තකාලයේ විකිණීමට තබා ඇති පොත් තොගයේ වටිනාකම ගණනය කර තිබෙනුයේ පිරිවැය පදනම් කරගෙනය. ඉදිරියේ දී විගණනය විසින් සඳහන් කර ඇති පරිදි පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගණනය කිරීමටත් එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47(අ) වගන්තිය ප්‍රකාරව හෙළිදරව් කිරීමටත් සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව අස්ථිත්වයේ සේවක ප්‍රතිලාභ බැදිම ගණනය කිරිමේදි ආයු ගණක ක්‍රමය යොදා ගත යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.5,496,157 ක් වූ පාරිතෝශික වෙන් කිරිම් ගණනයේ දී ආයු ගණක ක්‍රමය භාවිතා කර නොතිබුණි. | ඉදිරියේ දී සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව ආයු ගණන ක්‍රමය යොදා ගැනීමට සටහන් කර ගන්නා ලදි. | ප්‍රමිතියට අනුව කටයුතු කල යුතුය |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීමේදී හඳුනාගත් පෙර වර්ෂවල ක්ෂය ගණනය කිරීමේදී සිදු කරන ලද වැරදි නිවැරදි කිරීමේදී සහ සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කිරීම මත සිදු කළ යුතු ක්ෂය සඳහා ගැලපීම් සිදුකිරීමේදී හඳුනාගත් ඌණ ක්ෂය වෙන් කිරීම් නිවැරදි කිරීම සඳහා රු. 27,148,788ක් සමුච්චිත ලාභයෙන් හා සමුච්චිත ක්ෂය වෙන්කිරීම් ගිණුම් තුළින් ගලපා තිබුණි. එසේ වුවද දේපළ පිරියත හා උපකරණවලට අදාළව පසුකාලීනව දරන ලද පිරිවැය අතරින් ධාරණ අගයට එකතු නොකළ යුතු පිරිවැය ද ධාරණ අගයට එකතු කර ගිණුම්ගත කර තිබීම හේතුවෙන් රු. 27,148,788ක් වූ ක්ෂය ගැලපීම සහ සමාලෝචිත වර්ෂයේ රු. 4,056, 798ක් වූ ක්ෂය වියදම (අස්පෘෂ්‍ය වත්කම් සඳහා වූ ක්ෂය වියදම හැර) නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය සඳහා ආරම්භයේ සිටම ස්ථාවර වත්කම් ලේඛනයක් තිබී නොමැති අතර 2023 වර්ෂයේ දී ආයතනය ආරම්භයේ සිටම පරිහරණය කරනු ලැබූ හා මිළ දී ගැනීම් සම්බන්ධ තොරතුරු ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ දී විගණනය විසින් සඳහන් කර ඇති පුනරාවර්තන වියදම් ස්වභාවයේ වියදම්ද ඇතුළත් වී ඇත. මේ සඳහා අවශ්‍ය ගැලපීම් 2024 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛණය මගින් සිදු කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | වර්ෂයේ ක්ෂය වියදම සහ ක්ෂය වෙන් කිරීම නිවැරදිව සිදු කර ගිණුම්වල ගැලපීමට කටයුතු කල යුතුය. |
| (ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව වෙනත් වියදම් රු.15,951,802 ක් වුවද ඊට අදාළ සටහන් අංක 24 ට අනුව එම වටිනාකම රු.16,451,802 ක් වූයෙන් රු.500,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය තුළ සඳහන් වෙනත් වියදම් යටතේ දක්වා ඇති රු. 15,951,802/- ක වියදම නිවරදි වියදම වේ. එහෙත් සටහන් අංක 24 සකස් කිරීමේ දී වැරදීමකින් පුසතකාල පොත් මුද්‍රණ වියදම් ලෙස රු. 500,000/- ක වියදමක් ඇතුලත් වී ඇති හෙයින් සටහන් අංක 24 හි එකතුව රු. 16,451,802/- ක් ලෙස සටහන් වී ඇත. පුස්තකාල පොත් මුද්‍රණය සඳහා ඉහතින් සඳහන් කරන ලද පරිදි රු. 500,000/- ක වියදමක් දරා නොමැත එමෙන්ම මුදල් පොතේ සහ ලෙජර් ගිණුම්තුළ ද එවැනි වියදමක් ඇතුළත් නොවේ. එම නිසා මෙය අංක 24 දරන සටහන සකස් කිරීමේ දී සිදු වී ඇති දෝෂයක් බව දන්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි දක්වා ඇති අගයන් සටහන් සමග සංසන්දනය කර නිවැරදිතාවය තහවුරු කරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ සටහන් යටතේ දැක්වුණු අයිතම 05 ක සංසන්දනාත්මක සංඛ්‍යාවන්ගේ වටිනාකම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණු අගයන්ට වඩා රු.425,765 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනය විසින් සඳහන් කර ඇති පරිදි ගිණුම් සටහන් තුළ 2022 වර්ෂයට අදාළ තොරතුරු සටහන් කිරීමේ දී අතපසු වීමකින් ගිණුම් සටහන් තුළ පමණක් රු. 425,765/- ක් වැඩියෙන් සටහන් වී ඇත. මූල්‍ය ප්‍රකාශන තුළ නිවරදි අගය සටහන් කර ඇත. ඉදිරියේ දී ගිණුම් සටහන් සකස් කිරීමේ දී නිවරැදිව සකස් කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදිව අගයන් දැක්වීමට වග බලා ගත යුතුය. |
| (ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් නොවියයුතු නමුත් පෙර වර්ෂ ගැලපුම් ලෙස සමුච්චිත ලාභයට ගලපන ලද රු456,667.ක ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගෙවීමක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේ දී මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ දී සමුච්ත ලාභයට කරන ලද ගැලපීම් නිවරැදිව ගැලපීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඉ) 2023 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුව, ලංකා බැංකුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි පැවති ස්ථාවර තැන්පතු 18 කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා වූ පොළී ආදායම ලෙස රු.22,996,351 ක් මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා තිබුනද විගණනයේ ගණනය කිරීම් අනුව රු.23,342,094 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.345,743 ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි. | විගණනය විසින් සඳහන් කර ඇති ස්ථාවර තැන්පතු 05 සඳහා 2023 වර්ෂයට (සමාලෝචිත වර්ෂයට) අදාළ පොලී මුදල රු. 21,375,239.46 ක් වේ අදාළ පොලී මුදල 2023 වර්ෂයේ පොලී ආදායම් ගිණුම තුළ දක්වා ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශන තුල ද ඉහත සඳහන් අගයන් ඇතුළත් කර ඇති බව විගණනයට කාරුණිකව දන්වා සිටිමි. | ස්ථාවර තැන්පතු 18 කට අදාල පොලී ආදායම ගැන වාර්තාවේ සඳහන් කර ඇති අතර ඒවායේ නිවැරදි පොලී ආදායම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) මධ්‍යස්ථානය විසින් 1998 වර්ෂයේ ජේ.ආර් ජයවර්ධන මධ්‍යස්ථානය නැමැති අනුබද්ධිත පෞද්ගලික සමාගමක රු.5,000,000 ක් ආයෝජනය කර තිබුණු අතර එම සමාගම 2008 වර්ෂයේ වසා දමා තිබුණි. ආයෝජිත මුදලින් රු.700,000 ක් පමණක් ආපසු ලැබී තිබුණු අතර අදාළ සමාගම වසා දමා වසර 15 ක පමණ කාලයක් ගත වී තිබුණද උපලබ්ධි කර ගත නොහැකි රු.4,300,000 ක මුදල සම්බන්ධව අවශ්‍යකරන ගිණුම්කරණ ගැලපීම් සිදුකර නොතිබුණි | පාලක මණ්ඩලයේ අනුමැතිය ද සහිතව එවකට පාලක මණ්ඩල සාමාජිකයෙකුව සිටි ප්‍රදීප් ජයවර්ධන මහතාගේ සභාපතිත්වයෙන් යුතුව ආරම්භ කරන ලද J.R.Jayewardene Information centre ආයතනය 2008 වසරේ දී බුන්වත්වීම නිසා වසා දමා ඇත. මේ හේතුව නිසා අදාල ආයතනයෙන් මෙම මුදල හෝ ඒ සඳහා හිමිවිය යුතු ලාභාංශ කොටස් ලබා ගැනීමේ හැකියාවක් නොමැති හෙයින් මූල්‍යය තත්ත්ව ප්‍රකාශනයේ දිගුකාලීන ආයෝජනතුල ඇතුලත් J.R.Jayewardene Information | නිවැරදිව ගිණුම් වල හෙලිදරව් කල යුතුය. |

| | | |
|---|---|---|
| | Centre තුළ ආයෝජනය කරන ලද රු 4,300,000.00 ක මුදල දිගුකාලීන ආයෝජන තුලින් ඉවත් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කරනු ලැබූ අතර මෙම ආයෝජනය ගිණුම් තුලින් ඉවත් කිරීම සඳහා මහභාණ්ඩාගාරය විසින් බුද්ධශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ නිර්දේශ සඳහා යොමු කර තිබේ. | |
| (උ) සේවකයා අවසන් වරට ලබා ගන්නා ලද වැටුපේ අඩක් සේවා කාලයෙන් ගුණ කර පාරිතෝෂික වෙන් කිරිම ගණනය කර තිබුණද සේවා කාලය ගණනයේ දි පූර්ණ වර්ෂ සඳහා පමණක් නොව සේවය කල මාස ගණන ද සැලකිල්ලට ගෙන පාරිතෝෂික ගණනය කර තිබීම හේතුවෙන් මධ්‍යස්ථානයේ සේවකයන් 22 දෙදෙනකු වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.234,897 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනය විසින් සඳහන් කර ඇති ආකාරයට පාරිතෝෂිත වෙන් කිරීම් ගණනය කිරීමේ දී සේවකයාගේ සේවා කාලය ගණනය කිරීමේ දී වැරදීමකින් සේවය කර තිබෙන මාස ගණන සඳහා ද පාරිතෝෂිත වෙන් කිරීම් සිදු කර තිබේ. ඉදිරියේ දී මේ සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට සටහන් කර ගන්නා ලදි. | පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පාරිතෝෂිත ගණනය කල යුතුය. |
| (ඌ) මධ්‍යස්ථානය විසින් ආරම්භයේ සිට 2022 වර්ෂය දක්වාම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර 2023 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ස්ථාවර වත්කම් ලේඛනයට අනුව පසුකාලීනව දරන ලද පිරිවැය ගිණුම්ගත කිරීමේදී, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 21 ඡේදයට පටහැනිව 2014 වර්ෂයේදී මිලදී ගත් කාර් රථයකට අදාලව 2015, 2017 හා 2019 වර්ෂයන්හිදී ද2016 වර්ෂයේ මිලටගත් වෑන් රථයකට අදාලව 2016,2018 හා 2019 වර්ෂවලදී සේවාකිරීමේ ගාස්තු හා බැටරිය සවිකිරීම සඳහා පිළිවෙලින් ගෙවාතිබූ රු. 219,981 ක් හා රු.266,906 ක වටිනාකම ඒ ඒ වර්ෂවලදී ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් සමුච්චිත ක්ෂය හා පිරිවැය වැඩියෙන් දක්වා තිබුණි. | ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය සඳහා ආරම්භයේ සිටම ස්ථාවර වත්කම් ලේඛනයක් තිබී නොමැති අතර 2023 වර්ෂයේ දී ආයතනය ආරම්භයේ සිටම පරිහරණය කරනු ලැබූ හා මිළ දී ගැනීම් සම්බන්ධ තොරතුරු ඇතුළත් කර 2023 වර්ෂයේ දී ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ දී විගණනය විසින් සඳහන් කර ඇති පුනරාවර්තන වියදම් ස්වභාවයේ වියදම්ද ඇතුළත් වී ඇත. මේ සඳහා අවශ්‍ය ගැලපීම් 2024 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛණය මගින් සිදු කිරීමට සටහන් කර ගන්නා ලදි. | අයභාර වියදම් ප්‍රාග්ධනිත නොකල යුතු අතර, සමුච්චිත ක්ෂය හා පිරිවැය නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (එ) ඉඩම් හා ගොඩනැගිලි එකිනෙකට වෙනස් වූ දේපල, පන්තීන් 2 ක් වුවද වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත නොකොට ඉඩම් සහ ගොඩනැගිලි ලෙස එකම පන්තියක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව තක්සේරු කර ගැනීමටත් ඒවා ගිණුම් ප්‍රකාශන මගින් ඉදිරිපත් කිරීමටත් සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) පොදු අරමුදල | 111,972,301 | විස්තරාත්මක තොරතුරු | ආයතනය ආරම්භයේ සිටම පොදු අරමුදල ලෙස රු.111,972,301ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ සටහන් කර තිබූ බවත් 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළද පොදු අරමුදල ලෙස රු. 111,972,301 ක් දක්වා ඇති බව දන්වා තිබුණි. | විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ස්ථාවර තැන්පතු | 19,826,503 | ශේෂ පිරික්සුම සහ ලෙජරයේ දැක්වුණු ස්ථාර තැන්පතු අංකයන් සහ ශේෂ සනාථන ලිපියේ අංක වෙනස් වීම. | විගණනය විසින් සඳහන් කර ඇති පරිදි ලෙජර් ගිණුම් තුළ වැරදීමකින් මහජන බැංකුවේ තැන්පත් කර ඇති ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් ගිණුම් අංක ලෙස 2022 වර්ෂයේ ගිණුම් අංකයම සටහන් වී ඇත. එය ඉදිරියේ දී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලද බවත් දන්වා තිබුණි. | ලෙජර් ගිණුම තුල සඳහන් අංකයන් සහ බැංකු සනාථනයෙහි සඳහන් අංකයන්ගේ සැසඳීමක් සිදුකර මූල්‍යප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |
| (ඇ) හානිවූ පොත් තොගය | 389,235 | වටිනාකම ගණනය කළ පදනම හා විස්තරාත්මක උපලේඛනය | 2024 වර්ෂයේ දී අලෙවිය සඳහා පුස්තකාලයේ පවතින පොත් සම්බන්ධයෙන් සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා ස්වාධීන සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති බවත් එම සමීක්ෂණ මණ්ඩලය හරහා මේ සම්බන්ධයෙන් අදාළ ගැලපීම් කටයුතු සිදු කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | වටිනාකම ගණනය කළ පදනම හා විස්තරාත්මක උපලේඛනය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) 371(2)(අ) ඡේදය | මුදල් රෙගුලාසි වලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී මධ්‍යස්ථානයේ අංශ 03 ක සේවයේ නියුතු නිලධාරීන් 03 දෙනෙකු වෙත රු.40,000 ක සුළු මුදල් අතුරු අග්‍රිම ලබා දී තිබුණු අතර සුළු මුදල් අතුරු අග්‍රිමය නැවත ලබාදීමේ දී ඊට පෙර ලබාගන්නා ලද අතුරු අග්‍රිමයේ ගණන් හිලව් ඉදිරිපත් කළ යුතු වුවද එසේ ගණන් පියවීම් සිදුකර නොතිබිය දී නැවත අග්‍රිම ප්‍රතිපූර්ණය කිරීම අවස්ථා 03 කදී සිදුකර තිබුණි. | ඉදිරියේ දී සුළු මුදල් ආග්‍රිමය මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව ලබා දීමට සටහන් කර ගන්නා ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6) | 2023 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට මුදල් භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021හි ප්‍රකාශිත මෙහෙයුම් අත්පොත | | | |
| (i) 3.1 සහ 3.2 ඡේද | බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර භාණ්ඩාගාර අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | ඉදිරියේ දී විගණනය විසින් සඳහන් කර ඇති ආකාරයට කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1) හා 102 වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථානය විසින් ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර 2018/2019,2019/2020,2020/2021,2021/,2022 හා 2022/2023 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු ගෙවීමටද කටයුතු කර නොතිබුණි. | මධ්‍යස්ථානය ආරම්භයේ සිටම මේ දක්වා ආදායම් බදු ගෙවා නොමැති අතර මධ්‍යස්ථානය ලාභ ලැබීමේ අරමුණින් ක්‍රියාත්මක වන ආයතනයක් නොවන නිසා ආදායම් බදු නොගෙවූ අතර විගණනය විසින් සඳහන් කර ඇති තොරතුරු සම්බන්ධයෙන් ඉදිරියේ දී දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමටත් මහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වා තිබුණි. | ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 8,875,557 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 5,491,805 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,383,752 වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.10,462,081 කින් වැඩිවීම හා ශාලා කුලී ආදායම රු. 5,324,625 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යස්ථානයෙන් ඉවත්ව ගිය සේවකයන් තිදෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු 422,868.ක් වූ ණය ශේෂය 2024 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් සඳහන් කර ඇති හිඟ ආපදා ණය මුදල් කඩිනමින් ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී ඇති අතර තව දුරටත් හිඟ ආපදා ණය මුදල් ගෙවීම ප්‍රමාද කරනු ලැබුවහොත් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ණය ගිවිසුම ප්‍රකාරව ණය අය කරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මධ්‍යස්ථානය පිහිටි රූඩ් 3 පර්චස් 4.47ක් වූ ඉඩම, 1988 වසරේ මධ්‍යස්ථානය ආරම්භයේ සිටම පරිහරණය කර තිබුණද ඉඩමේ අයිතිය මධ්‍යස්ථානයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයේ ඉඩමේ අයිතිය 1988 අංක 77 දරන පනත මගින් ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයට පවරා ඇත. එමෙන්ම මෙම පරිශ්‍රයේ පිහිටා තිබෙන ගොඩනැගිලි සඳහාද වරිපනම් ගාස්තු ගෙවනු ලබනුයේ ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය විසිනි. අදාළ ලේඛන ඇමුණුම් අංක 05 යටතේ විගණනය වෙත ඉදිරිපත් කරමි. | පනත මගින් ඉඩමේ අයිතිය පැවරීමක් සිදු කල නොහැකි අතර නීත්‍යානුකූලව අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දැක්වුණු 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගොඩනැගිලි කුලි, පන්ති කාමර කුලි, විදුලි ගාස්තු සහ පිරිසිදු කිරීමේ ගාස්තු ශේෂය රු.11,604,906 ක් වූ අතර ඉන් රු.5,197,963 ක ශේෂය වසර 05 ද ඉක්මවා තිබුණද මධ්‍යස්ථානය විසින් මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් සඳහන් කර ඇති වසර 05 කට වඩා පැරණි අයවිය යුතු මුදල් 2012 මැයි මස සිට 2013 මැයි මස දක්වා විධිමත් ගිවිසුම් ප්‍රකාරව ලබා දී ඇති ගොඩනැගිලි පරිශ්‍රයන් සඳහා ලබා දී ඇති ආයතනයන්ගෙන් අයවිය යුතු මුදල් වන අතර මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරියේ දී අවශ්‍ය නීතිමය පියවර ගන්නා බව දන්වා තිබුණි. | ගිවිසුම ප්‍රකාරව කුලි අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 77 දරන ජේ ආර් ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ 03 වගන්තියේ සඳහන් සමාජිකයින්ගෙන් සමන්විත මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය රැස්කර ගැනීමේ අපහසුතාවයක් පැවතීම හේතුවෙන් 2015,2017 හා 2022 වර්ෂ වලදී එක්වරක් බැගින් පාලක මණ්ඩලය රැස් වී තිබූ අතර, මධ්‍යස්ථානයේ පරිපාලනය, කළමනාකරණය හා පාලන බලතල පැවරී ඇති පාලක මණ්ඩලය මෙසේ අඛණ්ඩව රැස් නොවී සිටීම මධ්‍යස්ථානයේ පැවැත්ම කෙරෙහි හා එදිනෙදා කාර්යයන් කරගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බැවින් වසර 25ක් පමණ පැරණි මධ්‍යස්ථාන පනතේ ඇතුළත් මෙම වගන්තිය ඇතුළුව අවශ්‍ය වන්නා වූ අනෙකුත් වගන්ති කාලානුරූපිව සංශෝධනය කර ගැනීමට මධ්‍යස්ථානය විසින් කටයුතු කළ යුතුව තිබුණද, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විගණනය විසින් සඳහන් කර ඇති ආකාරයට ආයතනයේ දෛනික කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පාලක මණ්ඩලය රැස්කර ගැනීමට පවතින ප්‍රායෝගික අපහසුතාවයට පිළියමක් ලෙස ආයතනය සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සම්පාදනය කරමින් සිටින බව දන්වා තිබුණි. | කාලානුරූපිව පනතේ වගන්ති සංශෝධනයට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද මධ්‍යස්ථානය විසින් 2023 වර්ෂයට අදාල ගිණුම් 2024 ඔක්තෝබර් 28 දින මාස 8 ක ප්‍රමාදයක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | ගිණුම් ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුත්තේ පාලක මණ්ඩල රැස්වීමක් පවත්වා අනුමැතිය ලබා ගනු ලැබූ රැස්වීම් සටහන් පත්‍රය සමඟ විය යුතු බැවින්, රැස්වීම් පැවැත්වීමට ප්‍රමාදවීම මේ සඳහා හේතු විය. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

### 4.2 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයෙන් ප්‍රකාශිත මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05ක් ඇතුළත වාර්ෂික වාර්තාව සභාගත කළ යුතු වුවත් අවසන් වරට 2010 වර්ෂයේ පසුව වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි. | ඉදිරියේ දී වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමේ සැලැස්මක් සකස් කර ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා තිබුණි. | මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුලත වාර්ෂික වාර්තා සභාගත කල යුතුය. |

### 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථානය පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කල බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණනයන් සිදු කිරීම සඳහා එම අස්ථිතයේ පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත්කරණු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතුය. |

### 4.4 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථානය විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. | 2022 වර්ෂයේ කාර්තු 04 සඳහා බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් පවත්වනු ලැබූ විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් සඳහා අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දෙන ලදි. එමෙන්ම එම කමිටු සඳහා සහකාර ගණකාධිකාරී සහභාගී වී ඇති බව දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් පත් කල යුතුය. |